# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 51 දරන
# ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 14 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1983 දෙසැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය**

මිළ : ශත 20 තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1983 අංක 51 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 14 වන දින.]

එල්. ඩී.—ඕ. 25/83

## ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 51 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 33 වන වගන්තියට ඉක්බිතිව ම, ඒ ආඥාපනතේ 33අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 420 වන අධිකාරයෙහි 33අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ප්‍රකාශයේ දින සිට නිදන් අරමුදලට දායක මුදල් නොගෙවිය යුතු බවට අමාත්‍යවරයා විසින් ප්‍රකාශයක් කළ හැකි බව.

33අ. (1) මේ ආඥාපනතෙහි හෝ වෙනත් යම් නීතියක හෝ මේ ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ පළ කරන ලද කිසියම් නියමයක හෝ කුමක් සඳහන්ව ඇත ද, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයක් කිරීමෙන්, ඒ ප්‍රකාශයේ දින සිට, මේ ආඥාපනත යටතේ ලබා ගන්නා ලද හෝ ලබා ගැනීමට යන හෝ කිසියම් ණය මුදලක් වෙනුවෙන් ජාතික ආර්ථිකයේ ආරක්ෂාව සඳහා, නිදන් අරමුදලට දායක මුදල් කිසිවක් නොගෙවිය යුතු යයි, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලබන අවස්ථාවක, ඒ පරිණත ණය නිදහස් කිරීම සඳහා විසර්ජන පනතෙහි විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.".

ඡ 073339—10,600 (83/11)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.